ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2314/87 - 2023 ජනවාරි මස 14 වැනි සෙනසුරාදා - **2023.01.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : MAT/LND/LA/4/1569.
*ඉඩම් අමාත්‍යාංශ යොමුව* : 4-3/15/2017/VE/410.

2022.09.09 දිනැති අංක 2296/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* මා විසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් ලේඛන භාර දීමේ දිනය 2023.04.26 ලෙස හා හිමිකම් පරීක්ෂණ පැවැත්වෙන දිනය 2023.05.10 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**එල්. කේ. මධූෂ සංකල්ප,**
ප්‍රාදේශීය ලේකම්,
මතුගම.

EOG 01-0135

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ජී.ඕ.ඩී.එස්/එල්.එන්.ඩී/05/ඒ/සී.කිවු/43.
*ඉඩම් අමාත්‍යාංශ යොමුව* : 4-3/8/2018/PC/209.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කර ඇති බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ විස්තර :*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රක්වාන නගර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රක්වාන ගමේ පිහිටි, සර්වේ ජනරාල් වෙනුවට රත්නපුර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති අවසානාත්මක ගම් පිඹුරු අංක 699 හි අතිරේක අංක 14 හා පත්‍ර අංක 14 හා 2022.10.18 දිනැති පිඹුරේ කැබලි අංක 881 ලෙස පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1265 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

1A - G 038579 – 19 (2023/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

01. කැබලි අංක 881
ඉඩමේ නම : ඩැල්වින් වත්ත, ඔරේන්ජ් ෆීල්ඩ් වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 5-10 පමණ වයසැති මිශ්‍ර බෝග වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: මොහොමඩ් සහීඩ් මොහොමඩ් හාරිස් සහ මොහොමඩ් ෂෙරීෆ්, මොහොමඩ් ඉයාස්; භූමි ප්‍රමාණය : හෙක්ටයාර් 0.1265

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 පෙබරවාරි මස 06 වැනි දින පෙ.ව. 10.00ට ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 පෙබරවාරි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී *ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල් හා එය ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

තව ද, තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

**ජී. එල්. ඩබ්. ඒ. ප්‍රතිභා,**
ප්‍රාදේශීය ලේකම්,
ගොඩකවෙල.

2023 ජනවාරි මස 02 වැනි දින,
ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01-0137

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.